SLGURU.LK

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2025**
**ஆண்டிறுதி மதிப்பீடு - 2025**
**Year End Evaluation - 2025**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම / பெயர் / Name ........................................................................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...................................

සැලකිය යුතුයි.

- **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.**
- **ප්‍රශ්න අංක 01 සිට 20 තෙක් ප්‍රශ්නවලට දී ඇති උත්තර අතුරින් නිවැරදි උත්තරය තෝරා එහි යටින් ඉරක් අඳින්න.**
- **I කොටසට ලකුණු 40කි.**

---

- **අංක 01 සහ 02 ප්‍රශ්නවල යටින් ඉරි ඇඳි කොටස්වල අර්ථයට වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.**

14427

01. නිලධාරීන් කඹ ඇදීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය.
    1. අවුරුදු උත්සවයක් පැවැත්වීම.
    2. නොසැලකිලිමත් වීම.
    3. එකඟතාවකට පත් නොවීම.
    4. ලණු ඇද බිම් සැකසීම.

02. අනුන්ගේ ඇද පලුදු සොයා තැන තැන කියවන ඔහු කාගේත් පිළිකුලට බඳුන් විය.
    1. අඩු ලුහුඬුකම්
    2. රෝගාබාධයන්
    3. අසරණකම්
    4. වග තුග

- **හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

03. පද්‍යය යනු තාලානුකූලභාවයෙන් යුක්ත වන සේ කරන ලද පද ...................................
    1. වියෝජනයකි.
    2. සංයෝජනයකි.
    3. විශේෂීකරණයකි.
    4. නිර්මාණකරණයකි.

04. ජාතියක ................................... භාෂාවයි.
    1. අනන්‍යතාව
    2. විභවතාව
    3. විචල්‍යතාව
    4. ශක්‍යතාව

05. විධිමත් මඟ පෙන්වීමකින් උසස් සාහිත්‍ය නිර්මාණ ................................... ආධුනිකයන් යොමු කළ හැකිය.
    1. පරිභෝජනයට
    2. පරිවෘත්තියට
    3. ප්‍රතිනිර්මාණයට
    4. පරිශීලනයට

06. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව වචන යෙදී ඇත්තේ,
    1. බුද්ධපුත්‍ර, මෛත්‍රී, ධර්මසේන, රාහුල
    2. ගඟසිරිපුර, දැතිගම්පුර, පඬුවස්නුවර, මන්දාරම්නුවර
    3. ගිරා, පරෙවි, හංස, සැළලිහිණි
    4. අලකේශ්වර, ජයපාල, සපුමල්, පතිරාජ

07. වචන හතරෙහි පළමු අක්ෂර හතරෙහි දීර්ඝ ඇදය, රකාරාංශය, ගයනුකිත්ත, දීර්ඝ ඉස්පිල්ල යන පිල්ලම් පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.
    1. සෑදීමෙන්, ක්‍රමවත්, පෞරාණික, චේතනාව
    2. නෑදෑයෝ, වෛශ්‍රවණ, කෘෂිකර්ම, සිතුමිණ
    3. රූපාවලිය, ශ්‍රද්ධාව, සෞන්දර්ය, ශීර්ෂය
    4. ඍනගිරව්, දෲමය, සෞභාග්‍යය, ප්‍රීතිමත්

08. සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය වන්නේ,
    1. මාළිගාව, සුභාශිංසන, මොළවනවා, ආශිර්වාද
    2. කරුවල, සළකුණ, පෙරළෙනවා, පිළියෙල
    3. නෙලුම්මල්, රතුලූනු, අකුළනවා, මෙණෙවිය
    4. සමීක්ෂණය, ශ්‍රවණාගාරය, පළඳනවා, නළාව

09. මහා ප්‍රාණ අක්ෂරයක් යෙදී නැති පදයක් ඇතුළත් වරණය තෝරන්න.
    1. ප්‍රධාන, සංඛ්‍යාව, ස්ථිර, වර්ධනය
    2. අභිප්‍රාය, ඵලදායී, සජ්ඣායනය, ප්‍රමුඛ
    3. සංධ්වනිය, උල්ලංඝනය, විභේදනය, ආරූඪ
    4. ශ්‍රේෂ්ඨ, ප්‍රසිද්ධ, ප්‍රාදුර්භූත, ප්‍රාගුණ්‍යය

10. මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන්නේ
    1. ස්වභාවය - ගතිය, හැටි, විලාසය, ඌරුව
    2. බබළන - උදුල්, දිමුතු, වොරඳන, දිලිසෙන
    3. උපද්‍රවය - අන්තරාය, උවදුර, අවදානම, ආපදාව
    4. දහ අට - අට දස, අෂ්ටාදශ, අටළොස්, දසට



For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

11. මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථවත් පදයක් ඇතුළත් වරණය තෝරන්න.
    1. නුසුදුසු - අයෝග්‍ය, අනුචිත, නොමනා, සරුප්
    2. ගින්දර - අනල, අග්නි, නල, ගිනි
    3. ප්‍රසිද්ධ - පළ, ප්‍රකට, පරසිඳු, අව්‍යාප්ත
    4. පරාධීන - යටත්, වහල්, අධීන, දීන

12. ධීවරයා මුහුදු යාමේදී 'ඉයත්තුව' කෙරෙහි සැලකිලිමත් වෙයි. 'ඉයත්තුව' යනු
    1. මුහුදු රළ
    2. සුළඟේ වේගය
    3. මුහුදේ ගැඹුර
    4. කාලගුණය

13. මිහිරියි හැමෝට ම
    සිරිලංකා කියන නම
    මේ මගේ මවු බිම
    වඳිමි සැලකිලි කරමි නිතරම යන පද්‍යයේ කතුවරයා වන්නේ
    1. කුමාරතුංග මුනිදාස මහතා ය.
    2. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ය.
    3. සුනිල් සරත් පෙරේරා මහතා ය.
    4. සුනිල් සාන්ත මහතා ය.

14. සාහිත්‍ය විචාරයේදී කාව්‍යය රස ගන්වන යෙදුම් හඳුන්වන්නේ,
    1. කාව්‍ය සංග්‍රහ යනුවෙනි.
    2. කාව්‍යෝක්ති යනුවෙනි.
    3. ව්‍යංග්‍යාර්ථ යනුවෙනි.
    4. අර්ථ රසය යනුවෙනි.

15. (අ) තීරයේ කෘතීන්හි නම් පිළිවෙළ අනුව (ආ) තීරයේ කතුවරුන්ගේ නම් පිළිවෙළ වන්නේ,

| (අ) | (ආ) |
|---|---|
| ★ කියවන නුවණ | ........................................ |
| ★ මහ දිගට ජනකතා | ........................................ |
| ★ සද්ධර්මරත්නාවලිය | ........................................ |
| ★ වෙල්ල වැහුම් | ........................................ |

    1. එදිරිවීර සරච්චන්ද්‍ර මහතා, ඩී. පී. වික්‍රමසිංහ මහතා, ධර්මසේන හිමි, කුමාරතුංග මුනිදාස මහතා
    2. ඩී. පී. වික්‍රමසිංහ මහතා, එදිරිවීර සරච්චන්ද්‍ර මහතා, ධර්මසේන හිමි, කුමාරතුංග මුනිදාස මහතා
    3. කුමාරතුංග මුනිදාස මහතා, එදිරිවීර සරච්චන්ද්‍ර මහතා, ධර්මසේන හිමි, ඩී. පී. වික්‍රමසිංහ මහතා
    4. කුමාරතුංග මුනිදාස මහතා, ඩී. පී. වික්‍රමසිංහ මහතා, ධර්මසේන හිමි, එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

- **අංක 16 හා 17 යන ප්‍රශ්නවල දී ඇති වාක්‍යයන්හි හිස්තැනට යෙදිය යුතු නිවැරදි උත්තරය තෝරන්න.**

16. ප්‍රධාන ශාලාවේ සිට අයෙක් පිටතට ........................................
    1. එති.
    2. එන්නේ ය.
    3. එයි.
    4. එනු ලබති.

17. ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමියන් විසින් රටට උගත් ශිෂ්‍ය පිරිසක් ................................
    1. දායාද කළ සේක.
    2. දායාද කළහ.
    3. දායාද කරන ලදහ.
    4. දායාද කරති.

18. මුලින් දී ඇති වර්ගයට ගැළපෙන උදාහරණයක් ඇතුළත් නොවන්නේ,
    1. නිපාත - අද අද එයි මරු පින් කර ගන්නේ
    2. විශේෂණ - කරන කලට පව් මීරිය මී සේ
    3. ගෞරවාර්ථ ප්‍රත්‍ය - සත් හට වන බව දුකට වෙදාණන්
    4. අසම්භාව්‍ය ක්‍රියා - සිඳිත මඬිත එක ලෙස පැතිරෙයි සුවඳ

19. විරාම ලක්ෂණ නිවැරදිව යෙදී ඇත්තේ,
    1. ව්‍යඤ්ජන ශබ්ද නිරූපණය කිරීමට යොදන අක්ෂර (ගාත්‍රාක්ෂර) ගතකුරු නම් වේ.
    2. හෝඩිය, 'වර්ණ මාලාව' යනුවෙන්ද හැඳින්වේ.
    3. ධර්මපාල ශ්‍රීමතාණෝ ''බුද්ධගයාව බේරා ගනිවු'' යන අභීත සිංහනාදය කළහ.
    4. අක්ෂර වින්‍යාසයේදී ශ, ෂ, ස භේදය පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

20. නිවැරදිව වචන වෙන් කොට ඇති වාක්‍යය තෝරන්න.
    1. විනයගරුක මිනිසුන් සිටින යහපත් සමාජයක් බිහි වේවා !
    2. මම ත් යහළුවෝ ත් හොඳින් පාඩම් කළෙමු.
    3. ගැමුණු මහරජු කර වූ රුවන්වැලි මහසෑය අපේ උරුමය කි.
    4. ගුරුතුමා ශිෂ්‍යයන් ලවා කරවන අභ්‍යාස ඇගයීමටද ලක් කළ යුතු ය.

(ලකුණු 2×20 = 40)


For Educational Purpose Only
SLGURU.LK

SLGURU.LK

## II කොටස

- පළමු හා දෙවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

01. පන්ති කාමරයේ දී ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (කෙටි කතා එකතුවක් ලෙස සැකසුණු)

   i. ඔබ කණ්ඩායමට පැවරුණු තේමාව කුමක් ද? (ලකුණු 02)

   ii. කෙටි කථාවේ චරිත නම් කරන්න. (ලකුණු 02)

   iii. කෙටි කතාව රචනා කිරීමේදී ඔබ සැලකිළිමත් වූ කරුණු 2 ක් ලියන්න. (ලකුණු 04)

   iv. ඔබ පරිශීලනය කර ඇති කෙටිකතා 2 ක් නම් කරන්න. (ලකුණු 02)

   v. ඔබ ලියූ කෙටිකතාවේ ලක්‍ෂණ 2 ක් නම් කරන්න. (ලකුණු 04)

   vi. මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ ලැබූ අත්දැකීම් 2 ක් ලියන්න. (ලකුණු 02) (මුළු ලකුණු 16)

02. පහත සඳහන් අ, ආ, ඇ, ඉ යන කොටස් වලින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු රචනාවක් ලියන්න.

   අ. විටෙක බියකරු විටෙක සුන්දර වනාන්තරය අසිරිමත් සිතුවිලි රසක් ජනිත කරවයි. ගලා හැලෙන දියඇලි වග වළසුන් ගහකොළ මේ සොඳුරු පරිසරයේ ඇත. 'වන පියසේ අසිරිය' යන මාතෘකාව ඇසුරින් රචනාවක් ලියන්න.

   ආ. දේශීය ආහාර පරිභෝජනයේ වැදගත්කම වර්තමානයේ දක්නට ලැබේ. ලෙඩරෝග වලින් වැළකීමට නිරෝගී දිවියකට ආහාරවල බලපෑම දැඩිව ඇත. ක්‍ෂණික කෑම අධික තෙල් සහිත පිටි සහිත කෑම ආහාරයට ගැනීම අහිතකරය. නමුත් දේශීය ආහාර වන කුරහන්, ධාන්‍ය වර්ග, කැඳ වර්ග, කොළ වර්ග වස විස නැති පලතුරු ආහාරයට ගැනීම නිරෝගී දිවියකට හේතු වේ. 'දේශීය ආහාර නිරෝගී දිවියකට හේතු වේ.' යන මාතෘකාව ඇසුරින් රචනාවක් ලියන්න.

   ඇ. සාරධර්ම වලින් යුක්ත සමාජයකට සාහිත්‍ය රසවින්දනය හේතු වේ. කවි ගීත රචනය රස විඳීමට හුරුවීම දරුවන්ගේ සිතුවිලි යහපත් කිරීමට හේතු වේ. දරුවන් ගේ මනසට සාහිත්‍ය රසය එක් කිරීමට හැකි නම් අධ්‍යාපන කටයුතුවලට ද යහපත් පිටුබලයක් ලැබේ. 'සාහිත්‍යය සිසු ජීවිතයකට අත්‍යවශ්‍ය වේ'. යන මාතෘකාව ඇසුරින් රචනාවක් ලියන්න.

   ඉ. තාක්‍ෂණය වර්තමානයේ සියලුම කටයුතු සඳහා අවශ්‍ය වේ. අධ්‍යාපන පද්ධතියට ද තාක්‍ෂණයේ බලපෑම දැඩිව පවතී. සිසු දරුවන් ද සිය දක්‍ෂතා හැකියා තාක්‍ෂණය මගින් වර්ධනය කර ගනියි. ඔවුන්ගේ අනාගත ලෝකයට ද තාක්‍ෂණික දැනුම ඉවහල් වනු ඇත. නව ලෝකයක කටයුතු තාක්‍ෂණය තුළින් දියුණු කර ගත හැක. 'තාක්‍ෂණය හා අධ්‍යාපනය' යන මාතෘකාව යටතේ රචනාවක් ලියන්න. (ලකුණු 14)

03. ඔබ පාසලේ විදුහල්පති ලෙස සිතා 9 ශ්‍රේණියේ දරු දැරියන්ට රූපවාහිනී සංස්ථාව නැරඹීමට අවසර ඉල්ලා එහි සභාපතිතුමාට යවන ලිපිය ලියන්න. (ලකුණු 10)

04. පහත ඡේදය කියවා වචන 30-35 අතර සාරාංශයක් ලියන්න.

අතීතයේ සිට ම මනුෂ්‍යයන් විවිධාකාර සන්නිවේදන ක්‍රම උපයෝගී කරගෙන ඇති අයුරු මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ ඉතිහාසය පිරික්සීමේදී පෙනේ. සන්නිවේදනය යනු කිසිවෙකු විසින් කිසියම් අදහසක් අන්‍යයන්ට දැනුම් දීමයි. මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ මුල් අවධියේ දී මෙන්ම අදත් මේ කටයුත්ත විවිධාකාරයෙන් සිදුවේ. උදාහරණයක් වශයෙන් ලංකාවේ වැදි ජනතාව අතර පැවති එක් සිරිතක් නම් කිසියම් වැදි පිරිසකට අයිති යැයි සැලකෙන ලද ගොදුරු බිම වෙත අන්‍යයන් ඒම වැළැක්වීම සඳහා, එනම් එම ගොදුරු බිම තමන් සතු බව අන්‍ය වැදි පිරිස්වලට දැනුම්දීම සඳහා යම් යම් ප්‍රකට ස්ථානවල සලකුණු සටහන් කිරීමයි. මෙහිදී නියමිත මායිම්වල පිහිටි ගස් කඳන් මත කිසියම් සංකේතයක් කොටන ලදි. (ලකුණු 10)

For Educational Purpose Only



SLGURU.LK

SLGURU.LK

05. පහත සඳහන් ප්‍රශ්නවලට පෙළපොත ඇසුරින් පිළිතුරු ලියන්න.

1. ''කොයි වැදිරිය වුණත් ලෝකෙ
හැඳ ගත්තම දුහුල් වස්ත්‍ර
ලා ගත්ත ම මුක්තහාර
වෙනත් පළඳනා අපමණ
   i. ඉහත කොටස උපුටාගත් පාඩමේ නම ලියන්න.
   ii. එහි රචකයා නම් කරන්න.

2. ''සර්........... මට ඔය කාරියට උදවු වෙන්ට අවසර දෙන්ට''
   i. මේ කොටස උපුටාගත් කතාවේ රචකයා නම් කරන්න.
   ii. මේ කොටස කවුරුන් විසින් කා හට කියන ලද්දක් ද?

3. ''...... ඇඹෙණියන් කැඳවා ගෙන අනුන්ගේ බිතක්නකට පලා ගොසින් රඳා හිඳිනාහු...''
   i. මෙහි සඳහන් වන තැනැත්තා කවුරුන් ද?
   ii. මේ කොටස උපුටාගත් මුල් ග්‍රන්ථය කුමක් ද?

4. ''රස පලවැල නෙලා දිදී රස්සා කළ අම්මා
සතර අපාවල නො ඉපදී නිවන් දකින් අම්මා
   i. මේ ප්‍රාර්ථනාව කරන්නේ කවුරුන් ද?
   ii. මේ කොටසට පාදක වූ කාව්‍ය ග්‍රන්ථය කුමක් ද?

5. ''බත් දෙකටක් උපයන්නට
අටු කොටු පුරවා දවසෙම...''
   i. මේ කවි පද දෙකෙන් කියවෙන්නේ කාගේ සිතුවිල්ලක් ද?
   ii. එහි රචකයා නම් කරන්න.

(ලකුණු 2×5 = 10)

06. පහත දී ඇති වාක්‍ය නිවැරදි කර ලියන්න.

i. අප විසින් ඔවුහු සොයමු.
ii. කෙනෙක් ගීත ගයමින් අප සතුටු කළේ ය.
iii. මැණියන් දෑ දරුවන් රකියි.
iv. තුරුපෙළ සුළඟින් ඉදිරී වැටෙති.
v. ඔවුන් නිරතුරු පොත් පත් පරිශීලනය කරන ලදි.

(ලකුණු 10)

07. පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිදහස මහ මුහුදක් වේ
එහි උල්පත පුත නුඹ වේ
ඒ බව සිහිකොට මෙ ලොවේ
යුතුකම ඉටු කළ යුතු වේ
    ජාතික රණ දෙරණ මතේ
    ගැටී වැටී මළ මොහොතේ
    සුන්දර සුරඹුන්ගේ අතේ
    නැළවෙන බව සිතනු පුතේ
ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලොවේ
සමත් වෙතොත් පුත නුඹ වේ

1. මේ කවි වලින් කියවෙන්නේ කුමන දෙයක් ගැන ද?
2. මෙහි සඳහන් පුතාගේ යුතුකම කුමක් ද?
3. අනුප්‍රාස රසය දනවන පද උපුටා දක්වන්න.
4. ජාතිය ආගමට සමාන කර ඇති වස්තූන් මොනවා ද?
5. මෙහි සුරඹුන්ගේ අතේ නැළවෙන බව සිතාගන්නේ කුමන කාරණයකට ද?

(ලකුණු 10)

For Educational Purpose Only



SLGURU.LK